# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 816/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 15/05/2024 පැය 1015

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01. 2024.05.14 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 48 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2024.05.14 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රාගම පොලිස් වසමේ කැටගේවත්ත පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 1600 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වූ රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** රාගම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන දුම්වැටි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2024.05.14 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පරසන්ගස්වැව පොලිස් වසමේ අසිරික්ගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **තීරු බදු රහිතව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 390 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පරසන්ගස්වැව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 29 ක් වූ අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පරසන්ගස්වැව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.

2024.05.14 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මොරටුව පොලිස් වසමේ මොරටුවැල්ල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 200ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 50 ක් වූ මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මොරටුව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 05. ගිනි අවි 02ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුර.

2024.05.14 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අම්බලන්තොට කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අම්බලන්තොට පොලිස් වසමේ කොග්ගල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්, විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ බෝර 12 ගිනි අවියට යොදන පතරොම් 03ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්තොට පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 34 ක් වූ අම්බලන්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** අම්බලන්තොට පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 06. බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය කල සැකකරුවෙකතු ටිපර් රථයක් සමඟ අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.

2024.05.14 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුට්ටිගල පොලිස් වසමේ කරවිලයාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව පස් ප්‍රවාහනය කල සැකකරුවෙකු ටිපර් රථය සමඟ** අත්අඩංගුවට ගෙන කුට්ටිගල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 31 ක් වූ පදලංගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුට්ටිගල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 07. බලපත්‍ර නොමැතිව පස් කැණීම සිදු කල සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.

2024.05.14 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත කුට්ටිගල පොලිස් වසමේ කරවිලයාය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව පස් කැණීම් කටයුතු සිදු කල සැකකරුවෙකු ජේ.සී.බී යන්ත්‍රයක් සමඟ** අත්අඩංගුවට ගෙන කුට්ටිගල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු අවුරුදු 48 ක් වූ පදලංගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** කුට්ටිගල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**